# පළමුවන පරිච්ඡේදය

## 1.1. හැඳින්වීම

"කලාව වූ කලී එක් අයෙකු විසින් සිතා මතාම යම් යම් බාහිර සලකුණු උපයෝගි කරගෙන අන්‍යන් ආසාදනය වන සේ ස්වකීය වේදිතයන් අන්‍යන් තුළ ජනිත කරවන මානව ක්‍රියාවලියක්" ලෙස ලියෝ තෝල්ස්තෝයි වරක් පවසා ඇත. එය සකල කලාංගයන්ටම පොදු වූ සාධකයක් ම වන්නේ ය. ශ්‍රී ලාංකේය නාට්‍ය ඉතිහාසය පිළිබඳව සලකා බැලුවහොත් එය මෙරට ආගමත්, භාෂාවත් මෙන්ම ඉන්දිය සංස්කෘතීන් ආදියෙම බිඳී ඇදී ආ දිගුවක් මිස ප්‍රෞඪ අතීතයකට හිමිකම් පාන්නා වූ දීර්ඝ ඉතිහාසයක් දෝතින් දරා ආවක් ලෙස හැඳින්විය නොහැකි ය. විෂම සමාජ ස්ථරයන් අතර ඇතිවූ පුළුල් සබැඳියාව හේතුකොට ගෙන නාට්‍ය කලාව සුවිශේෂි මුහුණුවරින් යුක්තව යළි යළිත් උපත ලබන්නට විය. මෙකී දිගුවෙහි ම උපරි ඵලයක් ලෙස ආකෘතිය අන්තර්ගතය මෙන් ම සන්දර්භීය ලක්ෂණ වලින් විෂම වන්නා වූ නාට්‍ය ප්‍රභේද කිහිපයක් හැත්තෑව අසූව අනූව දශකයන් තුළ පැහැදිලිව දැකගත හැකි විය. එකල විසූ නාට්‍ය ශිල්පීන් ගේ පාරිසරික සාධක නාට්‍යයේ ප්‍රවර්ධනයට ඍජුවම බලපෑම් කරන ලදී. මෙම කාල වකවානුව තුළ ජාත්‍යන්තර නාට්‍ය කලා ප්‍රවණතාවන්ගේ ආභාෂය ද දේශපාලනික සමාජීය වශයෙන් ඇති වූ නව සන්දර්භය ද හේතුකොට ගෙන නාට්‍යකරුවෝ එවකට පරාමය ලෙස සලකණු ලැබූ ශෛලිගත නාට්‍ය සම්ප්‍රදායෙන් බැහැරව වෙනත් ප්‍රකාශන ක්‍රම සෙවීමට උත්සුක වූහ.

උපතින් ම දේශපාලන සත්වයකු වූ මිනිසා නාට්‍ය කලාවට ද දේශපාලනය ඈඳා ගනුයේ තමා පෙලූ වේදිතයන් අන්‍යන්ට ආසාදනය කරනු සේම නොදැනුවත්භාවයේ ගිලී සිටින මහජනයා දැනුවත් භාවය කරා ගෙන යා හැකි මාධ්‍යයක් වශයෙන් නාට්‍ය කලාව යොදා ගත හැකි බැවිනි. නමුත් ශෛලිගත සම්ප්‍රදාය තුළින් මෙකී සමාජ සත්තාව මැනවින් නිරූපණය කළ නොහැකි යැයි අදහනු ලැබූ නිසා ස්වභාවිකවාදී නාට්‍ය රංග ක්‍රම සහිත නාට්‍ය කරා කෙමෙන් නාට්‍යකරුවන් ගමන් කරන්නට වූහ. දේශපාලන වශයෙන් ඇති වූ විවිධ ආන්දෝලනාත්මක සිද්ධීන් හමුවේ සමාජය දෙස විවේචනාත්මකව මෙන්ම ප්‍රශ්නකාරී ඇසින් සාමාන්‍ය ජනයාගෙන් වෙනස් දෘෂ්ටියකට උරුමකම් කී විවිධ නාට්‍ය ශිල්පීන් මෙකී සමාජ යථාර්ථය තම නාට්‍ය තුළින්

ප්‍රතිනිර්මාණය කිරීමට දැරූ උත්සාහයේදී ආකෘතිමය අතින් විශිෂ්ට වූ නාට්‍ය ප්‍රභේදයන් රාශියක් බිහි විය.

මේ නාට්‍ය ප්‍රභේදයන් තුළ දේශපාලනමය තේමා රැගත් නාට්‍යය ප්‍රවණතාවක් ලෙස වැඩී එන්නට විය. සතු පිපෙන්නා සේ වැඩී ආ මෙම දේශපාලනමය තේමා රැගත් නාට්‍ය කලාව ඇතැම් විචාරකයින්ගේ දෝෂ දර්ශනයට නොමඳව ම ලක් විය. රාජ්‍ය තන්ත්‍රයේ විදුලිතාවය, ඒකාධිපති පාලනය, ධනවාද පංති බලයට එරෙහිව අපි අමෝරන කම්කරු පංතියේ පිබිදීම, විප්ලවය, සටන හා අතුරුදහන් වීම් යනාදී වූ ප්‍රශ්නකාරී දේශපාලන තත්වය තම නාට්‍ය හරහා ප්‍රචලිත [illegible] කරන බල අරගලය තම නාට්‍ය තුළින් නිර්භයව විවේචනය කිරීමට ද මොවුන් නොපැකිළ ඉදිරිපත් වූහ. එකල මෙම නාට්‍ය නැරඹීම සඳහා පුරුදු පුහුණු වූ සහෘද ප්‍රේක්ෂක පිරිසක් සිටි අතර විවිධ අත්හදා බැලීම් හේතුකොටගෙන කලා ලෝකය උඩු යටිකුරු කළා වූ ප්‍රශස්ත මට්ටමේ නිර්මාණයන් ද බිහිවන්නට විය. රාජ්‍ය තන්ත්‍රයේ යහපැවැත්ම උදෙසා ගෙනු ලබන තීරණයන්හිදී රටේ සංස්කෘතික ප්‍රභූන් ලෙස වැජඹී කලාකරුවා තම මැදිහත්වීම ලබා දෙනු ලැබූවේ අභියෝගාත්මක නිසැකවූ ආකාරයෙනි. මොවුන් තම නිර්මාණ තුළට ගෙන ආවේද මෙකී තත්වයයි. මන්ද රටක බුද්ධිමත් ප්‍රජාව මහජනයා දැනුවත්භාවය කරා ගෙනයාම තම යුතුකමක් ලෙස ව්‍යක්තිමත් ලෙස සලකා ක්‍රියා කළ බැවිනි. එබැවින් ආකෘතික සන්දර්භීය අතින් ඉහළ මට්ටමකට ළඟා විය හැකි දේශපාලන නාට්‍ය ප්‍රවණතාවක පිහිටීම මෙම පූර්ව දශකයන් තුළ දැක ගත හැකි විය.

නමුත් අද කාලය වන විට යට කී දශකවලට වඩා වෙනස් වඩාත් සංකීර්ණ දේශපාලන සන්දර්භයක් තුළ මිනිසා සිරගතව සිටින ආකාරය දැකගත හැකි ය. පූර්ව දශකවල ජීවනෝපාය තත්වයන් බල පැවැත්වූව ද නිර්මාණකරුවකු ලෙස නාට්‍යකරුවා මෙතෙක් විට පසුබැසීමකින් තොරව ස්වාධීනව නිර්මාණකරණයේ නියැලුණු ආකාරය දැකගත හැකි ය. නමුත් වර්තමානය වන විට නාට්‍ය කලාව ද උත්තෝලනකාරයට මුහුණ පා ඇත්තේ මෙම සංකීර්ණ වූ දේශපාලන තත්වය හේතුවෙනි. රටේ බුද්ධිමත් ප්‍රජාව ලෙස සංස්කෘතික ප්‍රභූන් ලෙස ඉටුවිය යුතු මෙහෙය අයදහන කලාකරුවා තුළින් නිශ්ශබ්දතාවට පිළිබඳව දෙවරක් සිතිය යුතු කාරණාවකි. පූර්ව දශක තුළ විවිධ අත්හදා බැලීම් සහිතව නිර්මාණකරණයේ නියැලුණු කලාකරුවන් රාශියක් සිටි හෙයින් නාට්‍ය තුළ ද විවිධාකාර වූ දේශපාලන සංසිද්ධීන් කවීකාවන්ට බඳුන් කරන ලදී. නමුත් අද කාලයේ දේශපාලනය තම නාට්‍ය තුළට යොදා ගන්නා ආකාරය පිළිබඳව මෙතෙක් නාට්‍යකරණයේ නියැලෙන පිරිස සම්බන්ධව ද විවිධ ගැටළු පැන

නැත. මන්ද නාට්‍යකරණයේ නියැලෙන පිරිස මෙන්ම නාට්‍යයේ සහෘද ප්‍රේක්ෂකයා ද නාට්‍ය කලා තුළින් ඈත් වී ඇති ආකාරයක් දක්නට හැකි ය. පූර්ව දශක තුළ නාට්‍යයක් දර්ශනවාර ගණනාවක් රටපුරා ප්‍රදර්ශනය කළ ද අද්‍යතන නාට්‍ය කලාව කොළඹ හා තදාසන්න ප්‍රදේශවල පමණක් ව්‍යාප්ත වී ඇති ආකාරයක් දක්නට හැකිය. නමුදු කණගාටුවට කරුණක් වන්නේ නාට්‍ය නිර්මාණකරණයේ නියැලෙන්නන් පවා තම වගකීම මෙන්ම යුතුකම ලෙස සිතා පොදු වේදිකාවක් තුළින් මහජනයා දැනුවත්භාවය කරා රැගෙන යනු දක්නට නොහැකි බැවිනි.

මෙවැනි වූ සංකීර්ණ තත්වයන් හේතු කොට ගෙන අද්‍යතන දේශපාලන නාට්‍ය කලාව පූර්ව දශක තුළ නිෂ්පාදිත නාට්‍ය වලින් කලාත්මක අතින් මෙන්ම සන්දර්භීය ලක්ෂණ තුළින් ද වෙනස්වන්නා වූ ස්වභාවයක් මෙකී නාට්‍ය සංසන්දනය තුළින් ඉදුරාම දක්නට හැකිය.

මෙවැනි තත්වයන් හේතුකොටගෙන මාගේ පර්යේෂණ නිබන්ධය ලෙස අද්‍යතන දේශපාලන නාට්‍යයේ සුවිශේෂතා පිළිබඳ අධ්‍යයනයක නිරතවීමට මම බලාපොරොත්තු වෙමි. පූර්ව දශක වල කරළිගත කළ නාට්‍ය තුළ වූ දේශපාලන කතිකාමය ස්වභාවයන්ට වෙනස් වූ දේශපාලන දැක්මක් අද්‍යතන නාට්‍ය කලාව තුළ තිබේ ද යන්න සම්බන්ධව කරුණු ඉදිරිපත් කර බලා එවායේ සුවිශේෂ ලක්ෂණ පිළිබඳ අවබෝධයක් ලබා ගැනීමට මෙම පර්යේෂණ නිබන්ධය තුළින් නව දැක්මක් බලාපොරොත්තු වෙමි.

අද්‍යතනය වන විට තරුණ නාට්‍ය ශිල්පීන් පර්යේෂණ මට්ටමින් මෙන්ම විවිධ අත්හදා බැලීම් මගින් ද නිව්ව කලාවේ නව මංපෙත් විවර කරවීමට උත්සාහ දරනු පෙනේ. පූර්ව දශකවල නාට්‍ය කලාවන්ට සාපේක්ෂව මෙහි සුවිශේෂතා සමාජය තුළ පුළුල් කථිකාවන්ට භාජනය වන අවස්ථා විරල ය. අසූවේ දශක නාට්‍යයක් පවත්වන්නේ යැයි ලද ආරංචි මාත්‍රයක් ලබන නමුදු ඉන් එහාට වූ පුළුල් කථිකාවකට සූදානම් නැත. ඔවුන් නාට්‍යයට සමු දෙනුයේ නාට්‍යයේ අන්තර්ගත ආශය තුළින් සවිඥාණිකත්වයට හෝ ප්‍රශ්න කරා නමින් නොතොරවම ය. බොහෝ විට නාට්‍යයේ කතිකාමය හා කලාත්මක පාර්ශවය පිළිබඳව අවධානයක් යොමු නොකරනු ලබයි. එනම් නාට්‍ය තුළින් ප්‍රක්ෂේපණය කරන ලද දේශපාලනික සමාජ ආර්ථික සංස්කෘතික සත්තාවන් පිළිබඳව තම දැනුම මෙහෙයවනු නොලබයි. එසේ හෙයින් මෙම නිබන්ධය තුළින් අද්‍යතන දේශපාලන නාට්‍යවල සුවිශේෂතා පිළිබඳව මෙන්ම නාට්‍යයේ කලාත්මක හා කතිකාමය ලක්ෂණ හඳුනාගැනීමට පුළුල් අවධානයක් යොමු කිරීමට බලාපොරොත්තු වේ. තවද මේ පිළිබඳව සිදුකරන ගවේෂණයන් ද ඉතා විරල ය. පවතින වත්මන් ධනේශ්වර ආර්ථික ක්‍රමය තුළ එදිනෙදා තම දිවිය සරි කර ගැනීමට පොරබදන මහජනයාට මෙවැනි ගවේෂණවල යෙදීමට

කල වේලාවක් හෝ ඉඩ ප්‍රස්ථාවක් නොමැති වීම යුක්ති සහගතය. එබැවින් විද්‍යාර්ථියකු ලෙස මෙබඳු කර්තව්‍යයක් මෙම නිබන්ධය තුළින් ගොඩනැංවීම මගේ අපේක්ෂාවයි.

නාට්‍ය කලාව පිළිබඳව ලියැවී ඇති දහස් සංඛ්‍යාත පොත් පත් අප සමාජයෙහි තිබුණ ද දේශපාලනමය කේන්ද්‍ර රැගත් නාට්‍ය පිළිබඳ රචිත පොත් පත් අප අතර දැක ගත නොහැකි තරම් ය. එනම් අද්‍යතන දේශපාලන නාට්‍යයේ සුවිශේෂතා පිළිබඳ ගැඹුරු කර්තව්‍යයකට බඳුන් කරන ලද ශාස්ත්‍රීය නිබන්ධයක් හෝ ග්‍රන්ථ ඇත්නම් ඒ ද ඉතා අල්ප ය. එසේම එකී ග්‍රන්ථ හෝ නිබන්ධ තුළින් දේශපාලන නාට්‍යයේ කලාත්මක හා තාක්ෂණික ලක්ෂණ පිළිබඳව සාකච්ඡා කොට ඇති අවස්ථා දුර්ලභ ය. ඇතැම් විචාරකයන් මෙන් ම නාට්‍ය ශිල්පීන් ද මේ අද්‍යතන නාට්‍ය කලාව සම්බන්ධව යම් යම් පර්යේෂණාත්මක මට්ටමේ අත්හදා බැලීම් වල නිරත වුව ද ඒවායේ දැකගත හැකි හිඩැස් පිරවීමක් ලෙස ද මෙම නිබන්ධය හැඳින්වීම වඩා යෝග්‍යය. මෙකී කරුණු කාරණා හේතුකොට ගෙන මෙම පර්යේෂණ නිබන්ධය සඳහා උක්ත මාතෘකාව තෝරා ගන්නා ලදී. මේ සම්බන්ධව සිදු කර ඇති පර්යේෂණවල සාර්ථක අසාර්ථකභාවය පිළිබඳව පවත්නා යම් යම් ගැටළුකාරී තත්වයන් හේතුකොට ගෙන අද්‍යතන දේශපාලන නාට්‍යයේ සුවිශේෂතා පිළිබඳ පර්යේෂණාත්මක අධ්‍යයනයක නිරත වීමට මෙමගින් අපේක්ෂා කරමි.

## 1.2. පර්යේෂණ ක්‍රමවේදය

### 1.2.1. පර්යේෂණ ගැටලුව

අද්‍යතන දේශපාලන නාට්‍යය පූර්ව දශක දේශපාලනමය නාට්‍ය තුළින් වෙනස් වන්නා වූ සුවිශේෂී ලක්ෂණ තිබේද?

### 1.2.2. උපන්‍යාසය

අද්‍යතන දේශපාලන නාට්‍ය තුළ පූර්ව දශක දේශපාලනමය නාට්‍යයන්ට සාපේක්ෂව සුවිශේෂතා ලක්ෂණ දක්නට තිබේ.